ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන තරුණ තරුණියන් සඳහා සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වේ
(2026 පෙබරවාරි 23-27)

ශ්‍රී ලංකාවේ විවිධ දේශපාලන පක්ෂ 12ක සුළුතර ප්‍රජාවන් නියෝජනය කරන තරුණ තරුණියන් 24 දෙනෙකු 2026 පෙබරවාරි 23–27 දක්වා නොයිඩා හි ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර සංවර්ධන ජාතික ආයතනයේ (NIESBUD) පැවති සංවිධාන වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා නව්‍ය නායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහනක් සඳහා සහභාගී වූහ. කුසලතා සංවර්ධන සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශය යටතේ පවතින NIESBUD ආයතනය ව්‍යවසායකත්වය සහ කුසලතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුව, උපදේශකත්වය සහ පර්යේෂණ යනාදිය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රමුඛ පෙළේ ආයතනයකි.

2. තාක්ෂණික බාධාවන්, ආර්ථික අවිනිශ්චිතතාවයන් සහ වෙනස් වන භූ දේශපාලනික ගතිකයන් හමුවේ වේගයෙන් වෙනස් වන සහ සංකීර්ණ ගෝලීය පරිසරයක් තුළ සාර්ථකව කටයුතු කිරීම සඳහා සහභාගිවන්නන්ගේ නායකත්ව ඵලදායිතාවය ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ. මෙම වැඩසටහන නවීන නායකත්ව සංකල්ප මෙන්ම අන්තර් ක්‍රියාකාරී වැඩමුළු, ගෝලීය මනා පිළිවෙත් සම්බන්ධ සිද්ධි අධ්‍යයනයන්, කණ්ඩායම් ක්‍රියාකාරකම් සහ සැබෑ ලෝකයේ ප්‍රශ්න විසඳීමේ අභ්‍යාසයන් ඇතුළු අත්දැකීම් ඇසුරෙන් ඉගෙන ගැනීමේ ක්‍රමවේදයන්ගෙන් සමන්විත විය.

3. නව්‍ය නායකත්වය, නවෝත්පාදනය සඳහා නිර්මාණශීලී චින්තනය සහ ව්‍යුහගත ප්‍රවේශයන්, සේවක නියැලීම් ක්‍රමෝපායන්, නැවුම් චින්තනය හරහා ප්‍රශ්න විසඳීම, ඒ ඒ තත්ත්වයන්ට සුදුසු නායකත්වය සහ චිත්තවේගීය බුද්ධිය වැනි මාතෘකා ප්‍රධාන තේමාත්මක සැසි යටතේ ආවරණය කරන ලදී. මෙම සාකල්‍ය විෂය නිර්දේශය සහභාගිවන්නන්ගේ මූලෝපායික හැකියාවන් වැඩි දියුණු කිරීමට ඉවහල් වූ අතර ඔවුන් උගත් වැදගත් කරුණු ඔවුන්ගේ දේශපාලන සංවිධානවල තිරසාර වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා සෘජුවම භාවිතා කිරීමට ඔවුන්ව සවිබල ගන්වන ලදී.

4. සංස්කෘතික වටිනාකමකින් යුත් ස්ථාන වෙත චාරිකා ද මෙම පුහුණු වැඩසටහන යටතේ සංවිධානය කර තිබූ අතර ඒ අනුව මෙම පිරිස ටාජ් මහල් සහ අග්‍රා බලකොටුව නැරඹීමට ද එක් වූහ. එහිදී ඉන්දියාවේ සංස්කෘතික උරුමය දැක බලා ගැනීමට හැකි වූ අතර එය අවිධිමත් ඉගෙනීම සහ සංස්කෘතික වටහාගැනීම සඳහා අවස්ථාවක් විය.

5. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර ශ්‍රී ලාංකික වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බව ප්‍රකාශ කළ අතර ඒ අනුව මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ. දේශපාලන භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ කැපවීම මෙම වැඩසටහන තුළින් පිළිබිඹු වේ.

***

කොළඹ
*2026* මාර්තු *02*